ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව

දිනය 2012.12.11

## බැංකු අධ්‍යක්ෂවරුන්ගේ සම්මන්ත්‍රණය - 2012
## “$4K පශ්චාත් යුගයට බැංකු අංශය ස්ථාපිත කිරීම”

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාර්ෂිකව පවත්වන බැංකු අධ්‍යක්ෂවරුන්ගේ සම්මන්ත්‍රණය 2012 දෙසැම්බර් 12 දින පැවැත්වීමට නියමිතය. බලපත්‍රලාභී වාණිජ බැංකු 24ක සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 9 ක අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන විධායක නිලධාරීන් 200 කට වැඩි ප්‍රමාණයක් මේ සඳහා සහභාගී වනු ඇත. පස්වන වරටත් පැවැත්වෙන මෙම සම්මන්ත්‍රණයෙහි අරමුණ වන්නේ, නියාමන අවශ්‍යතාවයන්වල වෙනස්කම් ඇතුළුව ආර්ථිකය තුළ සිදුවන නව වෙනස්කම් වලට සංවර්ධනයන්ට සමගාමීව ඉදිරියේදී ඇති විය හැකි අභියෝගයන්ට මුහුණදීම සඳහා සහ නව ඉඩ ප්‍රස්ථා සොයා යාමේදී බැංකුවල ස්ථාවරත්වය වඩා ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් අදහස් හුවමාරු කර ගැනීමයි.

$4K ඒක පුද්ගල පශ්චාත් යුගයට බැංකු අංශය ස්ථාපිත කිරීම මෙවර අධ්‍යක්ෂවරුන්ගේ සම්මන්ත්‍රණයේ තේමාව වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති, අජිත් නිවාඩ් කබ්රාල් මහතා විසින් සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශනය පවත්වනු ඇත. මෙම සම්මන්ත්‍රණයේදී, ගෝලීය වෙළෙඳපල සංවර්ධනයන්, ද්‍රවශීලතා අවදානම් කළමනාකරණයෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්, මෙහෙයුම් අවධානම් තුරන් කිරීම සහ බැංකුවල ස්ථාවරත්වය වඩා ශක්තිමත් කිරීමෙහිදී මුහුණදිය හැකි අභියෝග පිළිබඳව සාකච්ඡා කරන අතර, මෙම සම්මන්ත්‍රණයට සහභාගී වන්නන්හට තම අදහස් සහ අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා තවදුරටත් ඉඩප්‍රස්ථාව ලැබෙනු ඇත.